සැ. යු. - (i) 2014.01.10 දින පළ වූ අංක 1,845 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවිය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2013 වර්ෂය සඳහා වූ ගාල්ල සහ බලපිටිය අධිකරණ කලාපයන්ට අයත් ජූරි සභිකයින්ගේ නාමලේඛනයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනේම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,846 - 2014 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2014.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 88 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 89 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 90 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 93 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.*

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 පෙබරවාරි මස 07 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.*

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

87 - B 80802 - 2,935 (2014/01)
B4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම**

වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථ දෙකක් සහ යතුරුපැදි එකක් ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම්පත්‍ර 2014 පෙබරවාරි මස 06 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, මඩකලපුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. ඉල්ලුම්පත්‍ර යැවීමේ දී ලියුම් කවරයේ ඉහළ කොටසේ "වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද වාහන සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරී තැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තිරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසාන දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

එක් එක් ලොරි රථ හා යතුරුපැදි සඳහා වෙන වෙන ම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා ආපසු නොගෙවන ලබන රු. 100 ක් සමඟ, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2014 පෙබරවාරි මස 05 වැනි දින ප. ව. 3.00 ට අවසන් වනු ඇත.

| *අනු. අංකය* | *වාහනයේ විස්තර* | *වාහනයේ වර්ගය* | *නඩු අංකය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංකය* | *තැන්පත් මුදල* |
|---|---|---|---|---|---|
| 1. | යතුර පැදි 01 | Hero Honda CBZ-X tream UG-5598 | B/610/10 | MC/VCH/01/2014 | 1000.00 |
| 2. | ලොරි රථ 01 | TATA Model 608, 42-6456 | 14933/F | MC/VCH/02/2014 | 1000.00 |
| 3. | ලොරි රථ 01 | TATA (Tipper) LE-0105 | 18408/PC | MC/VCH/03/2014 | 10,000.00 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2014 පෙබරවාරි මස 06 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහළ මිලක් සඳහන් කොට ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබා දෙයි. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ අධිකරණය විසින් සිදුකරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති වාහන කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදාළ වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතුව නිරීක්ෂණය කළ හැකි ය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියි නම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට ටෙන්ඩර් මණ්ඩලයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් වහාම අධිකරණ භූමියෙන් ඉවත කළ යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් සිදුකළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

ඉහත ටෙන්ඩර් මගින් සිදුකරන විකිණීම් පිළිබඳ අවසන් තීරණය ගැනීම මඩකලපුව සම්පාදන කමිටුව සතු ය.

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
මඩකලපුව.

01-382

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - මාරවිල

### අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මාරවිල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාළව රාජසන්තක කරන ලද සහ මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2014.02.08 වැනි සෙනසුරාදා පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින එය ආරම්භ කිරීමට පැයකට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

අදාළ භාණ්ඩ සඳහා ලන්සු තැබීමට අපේක්ෂා කරනු ලබන අයට අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේදී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර නොගන්නා බැවින් එකී අවස්ථාවේ දී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතු අතර එදින ප. ව. 4.00 ට පෙර මිළ දී ගනු ලබන භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

වෙන්දේසියේ දී භාණ්ඩ මිළ දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

අයි. එම්. ඩී. ඉලංගසිංහ,
මහෙස්ත්‍රාත්,
මාරවිල.

2014 ජනවාරි මස 02 වැනි දින,
මාරවිල, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | නඩු අංක රහිත | 38 ශ්‍රී 1847 ටොයෝටා දිරාපත් වී ඇති වෑන් රථය |
| 02. | නඩු අංක රහිත | අංක රහිත දිරාපත් වී ඇති ට්‍රැක්ටරය |
| 03. | නඩු අංක රහිත | 29 ශ්‍රී 9626 නිසාන් කැරවන් වෑන් රථය |
| 04. | ඒ. ආර්. 1647/12 | චැසි අංක සීඩී 50-1801126/එන්ජින් අංක සීඩී 50 ඊ - 1608663 යතුරු පැදිය |
| 05. | ඒ. ආර්. 682/13 | චැසි අංක ඩීයූඑෆ්බීඑම්ජී 85808/එන්ජින් අංක ඩීඕඑම්බීඑම්ජී 00488 බජාජ් සීටී 100 යතුරු පැදිය |
| 06. | ඒ. ආර්. 710/13 | අංක එම්. එච්. 3963 බජාජ් සීටී 100 යතුරුපැදිය |
| 07. | ඒ. ආර්. 710/13 | චැසි අංක ජේ සී 12-1106223 එන්ජින් අංක ජේසී 11-1300872 හොණ්ඩා සීබීඑක්ස් 125 යතුරු පැදිය |
| 08. | ඒ. ආර්. 716/13 | අංක 147-3312 හොණ්ඩා සීබී 125 ටී යතුරු පැදිය |
| 09. | 63671/සී | අංක එම්ජ් 4382 හොණ්ඩා සීබී 125 ටී යතුරු පැදිය |
| 10. | 74922 | චැසි අංක සී ඩී 50-1121206 එන්ජින් අංක සීඩී 50 ඊ 1115726 හොණ්ඩා සීඩී 50 යතුරු පැදිය |
| 11. | 72002 | අංක 135-4066 සුසුකි ආර්ජී 50 ඊ යතුරුපැදිය |
| 12. | 65280 | 151-4671 හීරෝ හොණ්ඩා යතුරු පැදිය |
| 13. | 18200 | චැසි අංක එම් ඩී 90-1940837 එන්ජින් අංක එම් ඩී 90 ඊ - 1940943 හොණ්ඩා එම් ඩී 90 යතුරු පැදිය |
| 14. | 24200 | අංක එම් බී 3998 ලොන්සින් යතුරු පැදිය |
| 15. | 19426 | එන්ජින් අංක එල්සී 147 එෆ්එම්එෆ් 01269828 ලොන්සින් යතුරුපැදිය |
| 16. | 85715 | චැසි අංක සී 90-3015810 එන්ජින් අංක සී 90 ඊ- 3025421 හොණ්ඩා සුපර් කප් 90 යතුරු පැදිය |
| 17. | 39574 | චැසි අංක සීබී 125 ටී - 1014426 එන්ජින් අංක සීබී 125 ටී ඊ - 1014429 හොණ්ඩා සීබී 125 ටී යතුරුපැදිය |
| 18. | 45418 | එන්ජින් අංක සීඑෆ් 50 ඊ 2820473 හොණ්ඩා චැලි යතුරුපැදිය |
| 19. | 36869 | චැසි අංක සී බී 125 ටී 1010909 එන්ජින් අංක සී බී 125 ටී ඊ - 1010912 හොණ්ඩා සීබී 125 ටී යතුරුපැදිය |
| 20. | නඩු අංක රහිත | අංක 155-0135 හොණ්ඩා එම්ඩී 90 යතුරු පැදිය |
| 21. | නඩු අංක රහිත | අංක ජේ එච් 9878 හොන්සන් සුපර් කප් යතුරු පැදිය |
| 22. | නඩු අංක රහිත | අංක 123-9439 හොණ්ඩා සීබී 125 ටී යතුරුපැදිය |
| 23. | නඩු අංක රහිත | අංක එච්එම් 8546 හොණ්ඩා ෂැඩෝ යතුරු පැදිය |
| 24. | ඒ. ආර්. 897/11 | සීපීයූ 02, කීබෝඩ් 01, මොනිටර් 01 |
| 25. | ඒ. ආර්. 456/13 | මොනිටරය |
| 26. | ඒ. ආර්. 541/06 | මොනිටරය, සීපීයූ 01 |
| 27. | ඒ. ආර්. 891/05 | ඇම්ප් 01 |
| 28. | ඒ. ආර්. 89/05 | වීසීඩී යන්ත්‍ර 01 |
| 29. | ඒ. ආර්. 05/13 | සිංගර් ටී වී 01 |
| 30. | ඒ. ආර්. 1268/10 | ඩීවීඩී යන්ත්‍ර 01 |
| 31. | ඒ. ආර්. 947/11 | ලැප්ටොප් පරිගණක 01 |
| 32. | ඒ. ආර්. 923/13 | මොනිටර් 01 (එල්සීඩී), කීබෝඩ් 01, ස්පීකර් යූපීඑස් තොගයක්, සීපීයූ තොගයක්, මොනිටර් සීඩී/ඩීවීඩී යන්ත්‍ර අඩංගු කේස් තොගයක් |
| 34. | 83364 | ගෑස් සිලින්ඩර් 01 |
| 35. | 84117 | ගෑස් සිලින්ඩර් 01, ලිප් 01 |
| 36. | 84525 | ගෑස් සිලින්ඩර් 04, ලිප් 02 |
| 37. | 84567 | ගෑස් සිලින්ඩර් 01 |
| 38. | 84627 | ගෑස් සිලින්ඩර් 01, ලිප් 01 |
| 39. | 69175 | ගෑස් සිලින්ඩර් 01, ඔක්සිජන් සිලින්ඩර් 01, කටර් ලාම්පු 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 40. | ඒ. ආර්. 830/12 | අත් පොරව |
| 41. | ඒ. ආර්. 772/11 | දුරකථන 02 |
| 42. | ඒ. ආර්. 83/11 | දුරකථන 01 |
| 43. | ඒ. ආර්. 518/12 | දුරකථන 01 |
| 44. | ඒ. ආර්. 885/12 | දුරකථන 01 |
| 45. | ඒ. ආර්. 1588/10 | දුරකථන 02 |
| 46. | 46917 | දුරකථන 01 |
| 47. | 56923 | දුරකථන 01 |
| 48. | 46918 | දුරකථන 01 |
| 49. | ඒ. ආර්. 1817/12 | වයර් රෝල් 01 |
| 50. | ඒ. ආර්. 577/12 | නයිලෝන් කඹය |
| 51. | 83183 | විදුලි තරාදි 01, පැකින් මැෂින් 01 |
| 52. | 85530 | සවල් 01, බාල්දි 02 |
| 53. | ඒ. ආර්. 964/10 | අත් ඔරලෝසු 02 |
| 54. | ඒ. ආර්. 735/09 | පිහිය |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 55. | ඒ. ආර්. 67/10 | පිහිය |
| 56. | ඒ. ආර්. 314/10 | පිහිය |
| 57. | ඒ. ආර්. 1927/09 | පිහිය |
| 58. | ඒ. ආර්. 953/10 | පිහිය |
| 59. | ඒ. ආර්. 258/10 | පිහිය |
| 60. | ඒ. ආර්. 87/11 | පිහි 01 |
| 61. | ඒ. ආර්. 502/11 | පිහි 01 |
| 62. | ඒ. ආර්. 1400/11 | පිහි 01 |
| 63. | තරාදි තොගයක් | |
| 64. | බැරල් තොගයක් | |
| 65. | කෑන් තොගයක් | |
| 66. | ඇලුමිනියම් මුට්ටි තොගයක් | |
| 67. | විදුරු බෝතල් තොගයක් | |
| 68. | නයිලෝන් ලනු තොගයක්. | |

01-531

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍යාමලී ඉනෝකා අත්තනායක විසින් ලියා සහතික කරන ලද අංක 3 සහ 1997.06.10 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් කෝට්ටේ, ඇතුල් කෝට්ටේ අංක 819/1 හි පදිංචි විතානගේ කල්පා යසෝදරී ගුණරත්න විවාහයට පෙර ගුණතිලක වන මා විසින් කෝට්ටේ, ඇතුල් කෝට්ටේ අංක 819/1 හි පදිංචි නෙල්ලම්පිටිය පතිරණ ආරච්චිගේ සුමනා නෙල්ලම්පිටිය යන අය වෙත පවරා දෙන ලද ඇටර්නි බලතල මෙයින් සම්පූර්ණයෙන් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත දන්වා සිටිමි.

තවද, එකී නෙල්ලම්පිටිය පතිරණ ආරච්චිගේ සුමනා නෙල්ලම්පිටිය විසින් එකී ඇටර්නි බලපත්‍රය මත සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මෙයින් පසු මා විසින් කිසිදු වගකීමක් නොදරණ බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

විතානගේ කල්පා යසෝදරී ගුණරත්න
විවාහයට පෙර ගුණතිලක.

01-422

---

## මෙඩ්වේ ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීමයි.

2013 දෙසැම්බර් මස 3 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 95864 යටතේ මෙඩ්වේ ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල, (5 වන තලය) හි, බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවණන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

01-446

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙහිවල, නැදිමාල, සමන් මාවතේ අංක 255/3ඒ/1 දරන ස්ථානයේ පදිංචි "කූල් කොම්" සමාගමේ අධිපති වන, අංක 722810597 V දරන ජාතික හැඳුනුම්පත හිමි, මොහමඩ් ආරිෆ් මොහමඩ් ඉක්බාල් වන මම පද්මිනි එච්. වේහැල්ල ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ අංක 4057 හා වර්ෂ 2011.08.20 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ඇති බවද, මින්පසු එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ අංක 821710588 V දරන ජාතික හැඳුනුම්පත හිමි අලිබ්ඩින් අම්සාද් විසින් කරණු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග නොකියන බව මහජනතාව වෙත දන්වා සිටිමි.

මොහමඩ් ආරිෆ් මොහමඩ් ඉක්බාල්.

2013 දෙසැම්බර් මස 26 වැනි දින.

01-449

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : කිව්නෙට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපිත දිනය : 2013.12.26
සමාගමේ අංකය : පී වී 96240
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 60, ෂූ පාර, කොළඹ 13.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

විනෝදිනී චන්ද්‍රිකා ද ෆොන්සේකා,
කිව්නෙට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ සමාගම් ලේකම්.

අංක 378, වොක්ෂොල් වීදිය,
කොළඹ 02.

01-450

---

### සෙනමන් කැන්සර් ජෙනොමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාපිත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීමයි.

2013 දෙසැම්බර් මස 20 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 96139 යටතේ සෙනමන් කැන්සර් ජෙනොමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 04, ගාලු පාර, අංක 4 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවණන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

01-447

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඩෙවෝන් එනර්ජි ජෙනරේෂන් (පී වී ටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 95639
ලියාපදිංචි ලිපිනය : අංක 141/7, වොක්ෂෝල් විදිය, කොළඹ 02

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

01-460

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඇටැන්වල එනර්ජි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 95635
ලියාපදිංචි ලිපිනය : අංක 141/7, වොක්ෂෝල් විදිය, කොළඹ 02

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

01-461

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : පිටවල පවර් බේස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 95637
ලියාපදිංචි ලිපිනය : අංක 141/7, වොක්ෂෝල් විදිය, කොළඹ 02

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

01-462

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : වරාපිටිය පවර් බේස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 95636
ලියාපදිංචි ලිපිනය : අංක 141/7, වොක්ෂෝල් විදිය, කොළඹ 02

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

01-463

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඕෂන් බෙස්ට් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 94866
ලියාපදිංචි ලිපිනය : "නාමල්" අංක 7 H, බ්‍රවුන්ස් හිල්, මාතර.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

01-464

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : හැන්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 94902
ලියාපදිංචි ලිපිනය : අංක 258, හැව්ලොක් පාර, කොළඹ 05.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

01-465

---

## මාළුස්සාකැලේ ප්‍රොපටි ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෙර සීගල් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(සමාගම් ලියාපදිංචි අංකය : පී. වී. 20388)

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුකූලව සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 08 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුකූලව 2013 දෙසැම්බර් මස 11 වැනි දින සිට සීගල් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෙර නාමය) එහි නාමය "මාළුස්සාකැලේ ප්‍රොපටි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" (නව නාමය) යනුවෙන් වෙනස් කොට ඇති බවත්, එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, (2 වන තලය) ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු),

අංක 28, (2 වැනි තලය),
ඩබ්ලිව්. ඒ ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

01-395

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තියේ විධිවිධාන ප්‍රකාර පහත සඳහන් සමාගම 2013 නොවැම්බර් මස 13 වැනි දින සංස්ථාගත කළ වගයි.

සමාගමේ නාමය : මොලීනා ග්‍රීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 95542
ලියාපදිංචි කාර්යාලය : අංක 156, මොක්ස් විව්, තුන්දූව, හබුරුගල, බෙන්තොට.

01-397

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මීගමුව මහාධිකරණ කලාපය තුළ පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් පී. දිල්රුක්ෂි එලිසබෙත් ප්‍රනාන්දු මහත්මිය විසින් 2001.10.03 වැනි දින ලියා සහතික කරන ලද අංක 3847 ඇටොර්නි බලපත්‍රය ප්‍රකාර කොච්චිකඩේ උඩංගාව, අංක 2 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. පත් අංක 715613140 V දරන වීරක්කොඩි ආරච්චිගේ ශිරෝමා දිල්හානි සිල්වා සහ එම ලිපිනයේ ම පදිංචි ජා. හැ. පත් අංක 641331627 V දරන මොල්ලිගොඩ ආරච්චිගේ මාක් ටෝනි විනිසියස් පෙරේරා යන අය විසින් උඩංගාව හි පදිංචි ජා. හැ. අංක 421820023 V දරන වීරක්කොඩි ආරච්චිගේ පෝල් ඈන්ටනි සිල්වෙස්ටර් සිල්වා යන අය වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

1. වීරක්කොඩි ආරච්චිගේ ශිරෝමා දිල්හානි,
2. මොල්ලිගොඩ ආරච්චිගේ මාක් ටෝනි විනිසියස් පෙරේරා

වර්ෂ 2013ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින දී ය.

01-401

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

හම්බන්තොට මරේ පාර, අංක 33/06 දරන ලිපිනයේ පදිංචි මොහොමඩ් නසීර් පවුසුල් අන්වර් වන මම හම්බන්තොට මරේ පාර, අංක 33/06 දරන ලිපිනයේ පදිංචි මොහොමඩ් රිසාන් නමැති අයට ප්‍රසිද්ධ නොතාරිස් මොහොමඩ් ශිරාස් යුසුෆ් මහතා සහතික කළ විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒ අනුව මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරන ලද ඉහත කී මොහොමඩ් රිසාන් විසින් මින් ඉදිරියට මා වෙනුවෙන් කරනු ලබන කිසිම කටයුත්තක් සම්බන්ධයෙන් වගකීමක් මා විසින් බාර නොගන්නා බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

මොහොමඩ් නසීර් පවුසුල් අන්වර්.

2013 දෙසැම්බර් මස 30 වැනි දින දී ය.

01-511

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමි.

නම : අර්මාන් ධාලා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 95891
සංස්ථාගත කළ දිනය : 2013 දෙසැම්බර් මස 4 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 74/63, කාලවිල වත්ත, මොරගල්ල, අළුත්ගම.

01-508

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ නිවේදනය

සමාගමේ නම : ඩිස්රප්ට් ඉනොවේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 94641
ලියාපදිංචි කාර්යාලය : අංක 409, 3 වැනි මහල, ගාලු පාර, කොළඹ 3

ඉහත සමාගම වෙනුවෙන්,

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,

409, 3 වැනි මහල,
ගාලු පාර, කොළඹ 3.

01-490

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 10, මරදාන මාළිගාකන්ද පටුමගෙහි 2 වැනි පටුමග, අංක 15/12 හි පදිංචි සහ දැනට ඩෙන්මාර්කයේ සිටින කමලා සුන්දරී තිවේන්ද්‍රම් වන මා (ජාතික හැඳුනුම්පත් අංක 476043450 වී හිමි) නයිබෝග් අධිනීතිඥ බී. කොලන්බර්ග් විසින් සහතික කරන ලදුව, කොළඹ 10, මරදාන, මාළිගාකන්ද පටුමග, 2 වැනි පටුමග, අංක 15/12 හි ම පදිංචි රාජේශ්වරී විනයාගමූර්ති (ජාතික හැඳුනුම්පත් අංක 455301440 වී හිමි) සහ රගුනාදන් පාකියලෙච්චුමි විසින් (ජාතික හැඳුනුම්පත් අංක 516442018 වී හිමි) මා වෙත ප්‍රදානය කරන ලද 2001 පෙබරවාරි මස 20 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

කමලා සුන්දරී තිවේන්ද්‍රම්.

01-488

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීමයි.

සමාගමේ නම : ප්ලාටිස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 63251
සංස්ථාගත කළ දිනය : 2008.03.03
ලියාපදිංචි ලිපිනය : අංක 22/1 4 වැනි පටුමග, මාදින්නාගොඩ, රාජගිරිය.

සමාගම් ලේකම්.

01-487

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ගෙකෝ ට්‍රෙකෝ (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 96241
දිනය : 2013.12.26
ලියාපදිංචි ලිපිනය : අංක 37/19 බී, දෙවැනි පටුමග, නාවල පාර, රාජගිරිය
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම එස්. ඊ. සී/(2) 2013/311

01-540

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 14, නවගම්පුර, 1 වන අදියර, ඊ 17 දරන තැන පදිංචි රාජපක්ෂ මුදලිගේ පියසීලි (ජා. හැ. අංක 606380704 වී), එම ලිපිනයේ ම පදිංචි රාජපක්ෂ මුදලිගේ පියතිස්ස (ජා. හැ. අංක 692920759 වී) රාජපක්ෂ මුදලිගේ ගුණවතී ජා. හැ. අංක 625420622 වී මාලිගාවත්ත ජාතික නිවාස අංක 765/151 ඒ දරන තැන පදිංචි රාජපක්ෂ මුදලිගේ පද්මාවතී, (ජා. හැ. අංක 606320639 වී), යන ඇටෝර්නි අධිපතීන් වන, අප විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාව වෙත දන්වා සිටින වගනම් : -

ඉහත කී අප කොළඹ දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් අරුණ නිශාන්ත පෙරේරා විසින් 2003.10.10 වැනි දින ලියා සහතික කරන ලද අංක 477 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් කොළඹ 10, මාලිගාවත්ත, බෝධිරාජරාම මාවතේ අංක 765/ඊ92 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අංක 812532707 වී දරන හැඳුනුම්පත හිමි එහි නම සඳහන් සින්නසාමි සිවා යන අය ඉහත කී අපගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරන ලද අතර එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර නිෂ්ප්‍රභා කරන ලද බවත් මින් ඉදිරියට අප වෙනුවෙන් එකී ඇටෝර්නි බලපත්‍රය මාර්ගයෙන් කරන යම් ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට අප වගකීම් නොදරන බවත් මෙයින් දන්වා සිටිමි.

රාජපක්ෂ මුදලිගේ පියසීලි,
රාජපක්ෂ මුදලිගේ පියතිස්ස,
රාජපක්ෂ මුදලිගේ ගුණවතී,
රාජපක්ෂ මුදලිගේ පද්මාවතී.

2014 ජනවාරි මස 02 වැනි දින දී ය.

01-539

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. - කිරුළපන ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ කිරුළපන පිහිටි ස්වර්ණ මාවතේ වරිපනම් අංක 51/53 දරන වැල්ලේ අම්බලමේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සින්නතායම් විසින් සාදන 1961 පෙබරවාරි මස 16 දාතම හා අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් බී 6 දරන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි තුනක් (අක්. 0 රූඩ් 0 පර්. 7.33) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය.-* හැව්ලොක් පාර දිගේ මයුරපති දේවාල පරිශ්‍රය දක්වා ගොස් ඉදිරිපිට ඇති ස්වර්ණා පාරට අවතීරණව පාරේ පටු කොටසේ කෙටි දුරක් ගොස් පාරේ පළල් කොටසට පිවිස එකී පාරේ ඉදිරියට ගොස් වම්පස පිහිටි වාහන යා හැකි පාරට පිවිස එකී පාර

ඔස්සේ පිහිටි නිවාස පේලියේ පාරේ දකුණු පස පිහිටි වරිපනම් අංක 51/53 දරන පරිශ්‍රයට ළඟාවිය හැකිය.

ටී. කේ. පොලී පැකේජින් ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතනයට ප්‍රදානය කළ ණය පහසුකම් වෙනුවෙන් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත උකස් කරන ලද ඉහත විස්තර කළ දේපළ 2014 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා පෙ. ව. 9.30 ට ආරම්භව පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනණු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013 ජූලි 05 වැනිදා *රජයේ ගැසට් පත්‍රය* ද 2013 ජූලි 19 වැනිදා "ඩේලි මිරර්" "ලක්බිම" සහ "තිනකරන්" පුවත් පත් ද බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල.-* සාර්ථක ගැනුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු යි.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකුණුම් බද්ධ,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුවරු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනස් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාළ වේ නම් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ. හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපි ලේඛන කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. සහකාර සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකි ය.

ඩී. කෙලාට් ඔක්ෂන්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ වෙළෙන්දෝ.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස්,
දුටුගැමුණු විදියෙන් හැරී කොහුවල.
දුරකථන අංක 011-4302622/011-4302623/ෆැක්ස් අංකය 2856013.

01-548

---

## ප්‍රසිද්ධ වෙන්දේසිය

1990 අංක 4 දරන බැංකු මගින් ණයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ, කටුගම්පොල හත්පත්තුවේ, කිනියාම කෝරළේ බිංගිරියේ පිහිටි දංගස්පිටියේවත්ත, කොහොඹගහවත්ත, දංගස්පිටියේහේන, දික්හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. නන්දසේන විසින් මැන සාදන ලද අංක 1637 සහ 2004.07.01 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 2 නමැති බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය : අ. 1 රූ. 0ප ර්. 0

අක්කර එකක් විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ, කටුගම්පොල හත්පත්තුවේ, කිනියාම කෝරළේ බිංගිරියේ පිහිටි දංගස්පිටියේවත්ත, කොහොඹගහවත්ත, දංගස්පිටියේහේන දික්හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. නන්දසේන විසින් තදනන්තරව මැන සාදන ලද අංක 2999 ඒ සහ 2008.11.24 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 1 නමැති බෙදා වෙන් කළ කොටස.

ප්‍රමාණය : අ. 0 රූ. 2 පර්. 9

රූඩ් දෙකයි, පර්චස් නවයක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය.

ඉහත 2 වැනි උපලේඛනයේ සඳහන් දේපළ ඉහත කී දංගස්පිටියේවත්ත, කොහොඹගහවත්ත, දංගස්පිටියේහේන, දික්හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. එම්. පීටර් ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2746 දරන 1991.09.26 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 03 නැමති බෙදා වෙන් කළ ඉඩමේ නැවත මැනීමක් වේ.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එල්. පී. ධම්මික විසින් සහතික කරන ලද අංක 1477 දරන බැඳුම්කරය මත යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී. එල්. සී. වෙත, හෙට්ටිආරච්චිගේ ෆ්‍රෑන්ක් රංගන සම්පත් පෙරේරා නොහොත් හෙට්ටිආරච්චිගේ ෆ්‍රෑන්ක් රංගන සම්පත් යන අය විසින් ඉහත 1 සහ 2 උපලේඛනයන් හි සඳහන් කර ඇති දේපළ උකස් කොට ඇති අතර ලබාගෙන ඇති මූල්‍ය පහසුකම් සඳහා අය විය යුතු මුදල් නිසි පරිදි ආපසු ගෙවීම හෙට්ටිආරච්චිගේ ෆ්‍රෑන්ක් රංගන සම්පත් පෙරේරා නොහොත් හෙට්ටිආරච්චිගේ ෆ්‍රෑන්ක් රංගන සම්පත් යන අය විසින් පැහැර ඇති හෙයින් යුනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2014ක් වූ පෙබරවාරි මස 07 වැනි දින ප. ව. 12.00 ට අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* උපලේඛන 1.- හලාවත සිට කුරුණෑගල මාර්ගයේ කි. මී. 15 පමණ ගමන් කළ විට බිංගිරිය මංසන්ධිය හමු වීමට කි. මී. 1.25 ට පමණ පෙර වමට ඇති පෙරකදෝරුවත්ත පාරට හැරී තවත් මීටර් 100 පමණ ගමන් කළ විට අදාළ දේපළ දකුණු පසින් හමු වේ.

*උපලේඛන අංක 2.-* හලාවත සිට කුරුණෑගල මාර්ගයේ කි. මී. 15 පමණ ගමන් කළ විට බිංගිරිය මංසන්ධිය හමු වීමට කි. මී. 1.25 පමණ පෙර වමට ඇති පෙරකදෝරුවත්ත පාරට හැරී තවත් මීටර් 150 පමණ ගමන් කර දකුණට ඇති පාර සඳහා වෙන් කර ඇති කොටසේ තවත් මීටර් 60ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය. -* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් අතුළත යුනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරණ සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න.

කළමණාකරු - නීති, යුනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2374100

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ, සහ උසාවි
කොමසාරිස්වරු, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ (රාජ්‍ය
සහ වාණිජ බැංකු)

අංක 182, 3 වැනි මහල,
හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.

දුරකථන අංක : 077 - 3181891.

01-546

---

## සෙලාන් බැංකුව - අනුරාධපුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ණයකර ගැනීමේ (විශෙෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීමයි

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නගර සභා සීමාව තුළ, නුවරගම්පළාත, තිඹිරිකඩවල, පිහිටි බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද අංක 4429 සහ 1994.07.04 දාතම පිඹුරේ කැබලි අංක 1 වශයෙන් බෙදා වෙන් කර ඇති මෙම ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරු A 323/261 යටතේ ලියාපදිංචි කොට ඇත.

ප්‍රමාණය : අ. 2, රූ. 2, පර්. 0
(විශාල ඉඩම සහ ඒ තුළ ඇති වැව්ලි හා ඒ මත පිහිටි සියලුම දේ සමග)

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නගර සභා සීමාව තුළ නුවරගම්පළාත, තිඹිරිකඩවල පිහිටි බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද අංක 4429 සහ 1994.07.04 දාතම පිඹුරේ කැබලි අංක 2 වශයෙන් බෙදාවෙන් කර ඇති මෙම ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරුව A 323/262 යටතේ ලියාපදිංචි කොට ඇත.

ප්‍රමාණය : අ. 2, රූ. 0, පර්. 0
(විශාල ඉඩම සහ ඒ තුළ ඇති වැව්ලි ගහකොළ ගොඩනැගිලි හා ඒ මත පිහිටි සියලුම දේ සමග)

මෙම දේපළ ගමේ ගෙදර නූහු ලෙබ්බේ මොහොමඩ් රසීක් යන අය ණයකරු වශයෙන් සී/ස සෙලාන් බැංකුවේ නමට ලියා උකස් කරන ලද ඉහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2014ක් වූ පෙබරවාරි මස 03 වැනි දින ප. ව. 12.00 ට මා විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීම් කළ යුතු ආකාරය* .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැන්ක් පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරණ සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න.

ත්‍රිවංක සී සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරු
රාජ්‍ය සහ වාණිජ බැංකු.

ප්‍රධාන කළමණාකරු - නීති, සෙලාන් බෑන්ක් පී එල් සී,
සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක 011 -2456474, 011-2456458.

අංක 182, 3 වැනි මහල, හල්ස්ඩ්‍රෝප් වීදිය,
කොළඹ 12
දුරකථන අංක 011-2388318.

01-545

---

## මහජන බැංකුව - පිළියන්දල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ සුවාරපොල යන ගම පිහිටි "ගොරකගහදෙබැද්දේවත්ත" නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි, රූඩ් බින්දුවයි, පර්චස් දහනමයයි දශම හයයි එකක් (අ. 0, රූ. 0, පර්. 19.61) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 05 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.- 2009.08.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2009.10.12 වැනි දින දිනමිණ සහ ඩේලි නිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - පිළියන්දල නගරයේ සිට මොරටුව පාරේ කි. මී. 1ක් පමණ ගිය පසු මෙම දේපළ වම් පස ප්‍රධාන පාරට මුහුණ ලා පිහිටා ඇත. (මෙම දේපලේ සිට සුවාරපොල හන්දියට මී. 150ක් පමණ වේ.) (තුන් වන මහලේ වාණිජ ගොඩනැගිල්ලක් සහ දෙමහල් නිවසක් ඇත)

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත සහකාර කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කොළඹ පිටත) අංක 177 ඒ, හයිලෙවල් පාර, නුගේගොඩ, වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011- 2812260, 011-4305863
ෆැක්ස් අංකය : 011- 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011-5756356, 011-2334808 (ෆැක්ස්)
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථන අංක : 011-2419126, 075-0883265.

01-550

---

## මහජන බැංකුව - පිළියන්දල ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ දම්පේ යන ගම පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි, රූඩ් බින්දුවයි, පර්චස් තිස් හතරයි දශම අටයි බින්දුවක් (අ. 0 රූ. 0 පර්. 34.80) විශාල ඉඩම සහ එහිපිහිටි සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 06 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.- 2009.08.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2009.10.12 වැනි දින දිනමිණ සහ ඩේලි නිව්ස් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - පිළියන්දල නගරයේ සිට කි. මී. 1ක් පමණ මොරටුව පාරේ සුවාරපොල හන්දිය තෙක් ගොස් වම් පසට ඇති බටකැත්තර පාරේ කි. මී. 2ක් පමණ ගිය විට දකුණු පැත්තේ දුම්රිය පාරේ කි. මී. 2ක් පමණ ගිය පසු පාරට දකුණු පස මාම්පේ සංචාරක හෝටලයට මීටර් 500 කට පෙර මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කොළඹ පිටත) සහකාර කළමනාකරු, අංක 177 ඒ, හයිලෙවල් පාර, නුගේගොඩ, වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011- 2812260, 011-4305863,
ෆැක්ස් අංකය : 011- 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම)

කාර්යාලය : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011-5756356, 011-2334808 (ෆැක්ස්),
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථන අංක : 011-2419126, 075-0883265.

01-549

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - යාපනය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම විසින් 1986 මාර්තු මස 10 වැනි දින සාදන ලද පිඹුරු අංක 3622 හි ලොට් 3322 වන ඉඩමේ නැවත මැනීමක් වූ ලියාපදිංචි පිඹුරු අංක 2 වැල්ලවත්ත හි ලොට් ඩී 5 දරන මහවැල්ලවත්ත නමැති ඉඩම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය හා කොළඹ මහ නගර සභා සීමාවේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ වැල්ලවත්තේ ප්‍රනාන්දු පාරේ වරිපනම් අංක 18 නමැති ලොට් 3322 දරන පර්චස් දහහතරයි දශම තුනයි එක (අ. 0, රූ. 0, පර්. 14.31) නොහොත් හෙක්ටයාර් 0.0362

විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගහකොළ වගාවන් ගොඩනැගිලි ආදී සියලුදේත් සහ මාර්ග අයිතිය ද සමග වේ.

බලයලත් මිනින්දෝරු එම්. ඩී. බී. ආර්. ෆ්‍රැන්සිස් විසින් 2003 අගෝස්තු මස 06 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 1038 හි ලොට් 1 වශයෙන් දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා හැව්ලොක් ටවුම කොට්ඨාසයේ පිහිටි ලෝරන්ස් පාරේ වරිපනම් අංක 78 දරන පර්චස් දාසයක් (අ. 0 රූ. 0 පර්. 16) විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගහකොළ, වගාවන් ගොඩනැගිලි ආදී සියලුදේත් සහ මාර්ග අයිතිය ද සමඟ වේ.

කොළඹ 12, වේල්ල විදිය, අංක 102 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සීමාසහිත ඊස්වරා හගවාන් සහ පුද්ගලික සමාගම ණයකරු හැටියට සහ පරානිරූපසිංහම් වරධරාජසිංහම් සහ වරධරාජසිංහම් වසන්තිරාණි උකස්කරුවන් හැටියට ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත 1 සහ 2 උපලේඛනවල සඳහන් කරන ලද දේපළ

1 වන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 03 වැනි දින පෙ. ව. 10.30 ට සහ ;

2 වන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 03 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.03.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.03.12 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2014.01.17 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2014.01.17 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - වැල්ලවත්ත
වැල්ලවත්ත ගාලු පාරේ කොමර්ෂල් බැංකුව ඉදිරිපසින් ඇති ගාලු පාරේ සිට දෙහිවල දෙසට මීටර් 100ක් පමණ ගිය විට දකුණට හැරුණු විට ප්‍රනාන්දු මාවත හමුවේ. එම පාරේ මීටර් කිහිපයක් පමණ ගිය විට ඔබගේ දකුණු අත පැත්තේ ඇල්ෆ්‍රඩ් පෙදෙසට සහ ප්‍රනාන්දු මාවතට යාබදව කොනට වන්නට අදාළ දේපළ පිහිටා ඇත.

*බම්බලපිටිය .-*
බම්බලපිටිය ගාලු පාරේ ප්‍රසිද්ධ පිල්ලයාර් කෝවිල ඉදිරිපසින් ඇති ගාලු පාරේ සිට වැල්ලවත්ත දෙසට මීටර් කිහිපයක් පමණ ගිය විට වමට හැරුණු පසු ලෝරන්ස් පාර හමුවේ. එම පාරේ මීටර් 225ක් පමණ ගිය විට ඔබගේ දකුණු අත පැත්තේ අදාළ දේපළ පිහිටා ඇත. විරුද්ධ පසින් ප්‍රසිද්ධ සරස්වතී ශාලාව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ යාපනය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ජ්‍යෙෂ්ඨ කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 474, රෝහල පාර,
යාපනය.
දුරකථන අංක : 021- 2227414
ෆැක්ස් අංකය : 021- 2223148.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,

අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

01-542

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ප්‍රධාන කාර්යාලය (එෆ්. සී. බී. යූ)**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියනලද්දාවූ ද, 2006.03.28 සහ 2007.02.19 දිනැති අංක 2634 සහ 2791 දරන බැඳුම්කරය

යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එම්. සැම්සන් සිල්වා සහ කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2014ක් වූ පෙබරවාරි මස 05 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාවේ, කුරුදුවත්ත, කේම්බ්‍රිජ් පෙදෙසේ, වරිපනම් අංක 32 (යල්ටා නමැති පරිශ්‍රයේ බෙදා වෙන් කළ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. මර්ටන්ස් විසින් පිළියෙල කරන ලද 1943.05.21 වැනි දිනැති අංක 274 දරන පිඹුර ප්‍රකාර බෙදාවෙන් කරන ලද ලොට් අංක 18 ලෙස සලකුණු කළ ඉඩමට අයත් ගොඩනැගිලි සහ සියලු දේත්. විශාලත්වය පර්චස් විසි අටක් (අ. 0, රූ. 0, පර්. 28)

ඉහත ඉඩම නැවත මැනීමකට අනුව පහත පරිදි විස්තර කෙරේ :

ඉහත කී කේම්බ්‍රිජ් පෙදෙසේ වරිපනම් අංක 32 නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු සුගත් සමරවික්‍රම විසින් පිළියෙල කරන ලද 1992.11.26 වැනි දිනැති අංක 338/1992 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් ඒ ලෙස සලකුණු කළ ඉඩමට අයත් ගොඩනැගිලි සහ සියලුදේත්. විශාලත්වය පර්චස්විසි අටක් (අ. 0, රූ. 0, පර්. 28).

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2012.10.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2012.10.23 වැනි දින ලක්බිම, 20012.10.24 වැනි දින ඩේලිමිරර්, සහ 2012.10.23 වැනි දින තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට ගාලුමුවදොර සහ කොම්පඤ්ඤවීදිය හරහා අග්‍රාමාත්‍ය කාර්යාලය සහ කාන්තා විද්‍යාලය පසුකොට අර්නස්ට් ද සිල්වා මාවතෙන් (කලින් මල්පාර) කුමාරතුංග මාවත, කේම්බ්‍රිජ් පෙදෙස සහ රාජකීය මාවත මංසන්දිය දක්වා ගමන් කරන්න. කේම්බ්‍රිජ් පෙදෙසට වමට හැරී යාර කිහිපයක් ගියවිට අදාළ දේපළ එම පාරේ වම් අත පැත්තේ පාරට මුහුණ ලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112-34597.

01-485

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිරුළපන ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. එන්. එස්. සිල්වා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2012.12.28 දිනැති සහ අංක 190 දරන බැදුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම එයාටච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට සහ දර්ශනී සුනීතා කුමාරි පෙරේරා නොහොත් පීරිස් යන අය උකස්කරු පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2014ක් වූ පෙබරවාරි මස 07 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාව තුළ පිහිටි තිඹිරිගස්යායා වසම් අංක 40 තිඹිරිගස්යාය පිහිටි ටොරින්ටන් ඇවනියු ඔස්සේ ටොරින්ටන් ඇවනියු හි වරිපනම් අංක 290/2 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. විජේවීර විසින් 2002.11.12 දින සාදන ලද අංක 2074 දරන පිඹුරේ ලොට් එෆ් ලෙස සලකුණු කරන ලද විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත්. විශාලත්වය අක්. 0 රූඩ් 0, පර්චස් නමයයි දශම එකයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 9.12)

එකී අංක 190 දරන උගස් බැදුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ප්‍රවේශ මාර්ග අයිතීන් ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.12.06 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2013.12.11 වැනි දින ඩේලිමිරර්, තිනකරන් සහ ලක්බිම පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - බෞද්ධාලෝක මාවතෙන් මෙන් ම ටොරින්ටන් පෙදෙසේ දකුණු පසින් (SLBC ඉදිරිපස) එනම් තිඹිරිගස්යාය මංසන්ධියේ සිට තිඹිරිගස්යා මාර්ගයේ පැමිණ වම් අත පැත්තේ ඇති ටොරින්ටන් පෙදෙසට පැමිණ එහි අඩි 12ක් පමණ ගියවිට වරිපනම් අංක 290/2 දරන දේපළට ළඟාවිය හැක. (දුරස්ථ පාලක ගේට්ටුවක් සහිත දේපළ) නැතහොත් තිඹිරිගස්යාය මාර්ගයෙහි පිහිටි පුද්ගලික මාර්ගයකින් ද අදාළ දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478. 0112 - 337707
ෆැක්ස් අංකය : 0112- 337707.

01-486

---

## පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 09 දෙනකු 2014. 01.25 වැනි දින පැය 0900 ට මහනුවර, අස්ගිරිය, පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම නිල සුනඛයින් එදින උදේ පැය 0800 ට පරීක්ෂා කර බැලිය හැකි බව දන්වා සිටිමි.

| *අනු අංකය* | *වර්ගය* | *පිරිමි* | *ගැහැණු* | *එකතුව* |
|---|---|---|---|---|
| 01. | ජර්මන් ෂෙපර්ඩ් | 02 | 01 | 03 |
| 02. | බෙල්ජියම් මැලනෝයිස් | - | 01 | 01 |
| 03. | ඩොබමන් පිනස්චර් | - | 01 | 01 |
| 04. | ලැබ්‍රඩෝර් රිට්රිවර් | 01 | 01 | 02 |
| 05. | රොට් වයලර් | 01 | - | 01 |
| 06. | ඇලස්කන් මැලමුත් | - | 01 | 01 |
| | එකතුව | | | 09 |

සිසිර වීරකෝන්,
පොලිස් අධිකාරී.

2013 දෙසැම්බර් මස 27 වැනි දින,
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය - මහනුවර.

01-381

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇල්පිටිය දිසා අධිකරණයේ දී ය

ඇල්පිටිය, අම්බලන්ගොඩ පාරේ, අංක 51 ඒ දරන ස්ථානයේ "ඇල්පිටිය ශාඛාව" යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තාවූ, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, අංක 21, දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

නඩු අංකය :
11/MB

..............................*පැමිණිලිකරු*

එදිරිව

ඇල්පිටිය, කුරුඳුගහ හැතැක්ම සිංහ පතිරාජ අංක 373/2, දරන ස්ථානයේ තොම්මයා හේව සුජිත් ප්‍රේමසිංහ

..............................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2013ක් වූ මාර්තු මස 15 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම්කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු

(අ) (i) රු. 8,45,300 ක මුදලක් සහ රු. 58,884.43 ක මුදලක් යනුවෙන් එකතුව රු. 9,04,184.43 වන්නා වූ මුදලක් සහ එකී රු. 8,45,300 ක මුදල මත 2011 ජූලි මස 26 වැනි දින

සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 10.5% බැගින් වැඩිදුර පොළිය ද,

(ii) රු. 845,300 ක මුදලක් සහ රු. 63,651.34 ක මුදලක් යනුවෙන් එකතුව රු. 908,951.34 වන්නාවූ මුදලක් සහ එකී රු. 845,300 ක මුදල මත 2011 ජූලි මස 26 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කනර තෙක් වර්ෂයකට 10.7% බැගින් වැඩිදුර පොළිය ද,

(iii) රු. 750,000 ක මුදලක් සහ රු. 63,253.80 ක මුදලක් යනුවෙන් එකතුව රු. 813,253.80 වන්නා වූ මුදලක් සහ එකී රු. 750,000 ක මුදල මත 2011 ජූලි මස 26 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 15% බැගින් වැඩිදුර පොළිය ද,

(ආ) අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇති හෙයින් ද,

තව ද, තීන්දු ප්‍රකාශයෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2013ක් වූ මාර්තු මස 15 වැනි දින ඇල්පිටිය දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ අංක 3/5 ඇල්ල පාර යන ස්ථානයේ දී වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 13 වැනි දින පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ ඇල්ල කහ බද්දේගම ග්‍රාමයේ පිහිටි ඇල්ල පාරේ වරිපනම් අංක 3/5 දරන තානායම්කන්ද හෙවත් ඉගල්කැලේ නමැති ඉඩමේ අංක 957 බිම් කැබැල්ලේ අංක 957 F ලකුණුකර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර තිබෙන බිම් කොටස එහි පිහිටි පස ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 477/244 හි ලියාපදිංචි කර ඇති බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. ආරියසේන විසින් මැන සාදන ලද අංක 2905 සහ 2007.06.26 වැනි දින දරන සැලැස්මේ නිරූපිත පරිදි අංක 957 එෆ් බිම් කැබැල්ලට මායිම් උතුරට : අංක 957 ඊ බිම් කැබැල්ල නැගෙනහිරට : එම ඉඩමේ ම අංක 954 බිම් කැබැල්ල සහ 955 බිම් කැබැල්ල, දකුණට : එම ඉඩමේ ම අංක 957 ජී බිම් කැබැල්ල සහ අංක 11 සී බිම් කැබැල්ල (පාරට වෙන් වූ කොටස) සහ බස්නාහිරට : අංක 11 සී බිම් කැබැල්ල ද (පාරට වෙන් වූ කොටස) තණ බද්දේගමට වැටී ඇති මහපාර සහ එම ඉඩමේ ම 957 ඊ බිම් කොටස සහ එහි ප්‍රමාණය පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) හෙවත් හතරැස් මීටර් 252.93ක් වේ.

එකී අංක 2905 දරන සැලැස්මේ නිරූපිත 11 සී බිම් කැබැල්ල මත ඔස්සේ සහ යට මාර්ග අයිතිය සහ අනිකුත් පරවශතා අයිතිවාසිකම් සහිතවයි. ඉහත කී ඇල්ල තණබද්දේගම පිහිටි තානායම්කන්ද හෙවත් ඉහල කැලේ නමැති ඉඩමෙන් වූ අංක 957 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කොටස බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි බී 477/156 හි ලියාපදිංචි කරනු ලැබ F. B. P. නිරූපිත පරිදි එකී අංක 957 දරන බිම් කැබැල්ල මායිම් උතුරට : අංක 952 බිම් කැබැල්ල, 953 බිම් කැබැල්ල සහ 954 බිම් කැබැල්ල, නැගෙනහිරට : අංක 954 බිම් කැබැල්ල සහ 955 බිම් කැබැල්ල සහ 956 බිම් කැබැල්ල දකුණට : 956 බිම් කැබැල්ල 11 බී 3 බිම් කැබැල්ල සහ 11 සී බිම් කැබැල්ල සහ බස්නාහිරට : 11 සී බිම් කැබැල්ල සහ 952 බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය හෙක්ටයාර් දශම දෙකයි හතයි හතරයි දෙකක් (හෙ. 0.2742) වේ.

*ඉඩමට පිවිසීම.*- ඇල්පිටිය අම්බලන්ගොඩ ප්‍රධාන පාරේ ගියවිට කුරුදුගහ හැතැප්ම් හංදිය හමුවේ. එම හංදියෙන් වමට හැරුණු විට ඇල්ල පාර හමුවේ. එම පාරේ මීටර් 60ක් ගියවිට පාරේ වම්පසින් මහජන බැංකුව ඉදිරිපිට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන්වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
02. නොතාරිස් ගාස්තු ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 10,500,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු සියයට දෙකයි දශම පහයි (2.5%),
05. රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු,
06. ලිපිකරු, බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත දී ඇල්පිටිය දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න : -

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ
වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස් වානිජ
මහාධිකරණය සහ කොළඹ දිසා
අධිකරණයේ සහ ගාල්ල දිසා
අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු.

රාජ්‍ය හා වාණිජ බැංකු අංක 182,
3 වැනි මහල, හල්ස්ඩොර්ප් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක 011-2445393/0112396520
ඊමේල් : senaservice@sltnet.lk

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වැනි මහල,
මරදාන පාර, කොළඹ 10
දුරකථන අංක: 011-2672262,
011-2672263
ෆැක්ස් අංකය : 011-2683073.

01-543

**ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී**
(කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

*අංක 418 සහ 320 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ පන්සල පාර, කොට්ටාවේ පිහිටි, සම්බුද්ධි ගොරකගහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එස්. ඒ. ඩබ්ලිව්. පෙරේරා විසින් සාදන ලද 2005 මැයි මස 24 වැනි දිනැති අංක 754 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 1990 අගෝස්තු මස 18 වැනි දිනැති අංක 3003 දරන පිඹුරේ ලොට් අංක බී 1 ලෙස දැක්වෙන ඉඩමේ නැවත මිනුමකි) සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 38.20

එහි පිහිටි ගොඩනැගිලි, පස, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව

"නිත්‍ය උකස්කරුට, ඔහුගේ ආගන්තුකයින්ට, ඉංජිනේරුවන්ට, ගිවිසුම්කරුවන්ට, වාස්තු ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කල්බදු හිමියන්ට මිත්මතුවට සහ ඉදිරියට ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාව මත ඕනෑම අරමුණක් සඳහා දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ දේපළට පැමිණීමට නැවත හැරී යාමට, පසුකර යාමට, පසුකර ඒමට, පයින් හෝ නැතහොත් කුමන අයුරකින් හෝ අශ්වයන් ගොනුන් හෝ වෙනත් සතුන් සහිතව හෝ රහිතව කාර් රථ ලොරි රථ හෝ වෙනත් ඕනෑම වාහනයක් නැවැත්වීමට, බඩු බෑමට, පැටවීමටත් පහත විස්තර කෙරෙන මාර්ගයේ ඉහත කී සියලුම අයිතීන් සමග තනිව හෝ සමූහ වශයෙන් අදාළ වාසි සහ සාමාන්‍යයෙන් අනුබද්ධව ඇති භාවිතාවන විඳින අයිතීන් සහ විදුලි රැහැන් එලීමටත්, වෙනත් රැහැන් එලීමටත්, මලනාලිකා, නල ජලය, ගෑස් සහ වෙනත් අවශ්‍ය දෑ එලීමටත් අනෙකුත් සියලුම ආකාරයේ උත්සාහයන් ඒ මත දිගේ හෝ සමග කිරීමටත් ආයනය, නිර්යාතය සහ ප්‍රතිගමනය සඳහා සම්පූර්ණ නිදහස් අයිතිය සහ බලය"

1. හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක ජී 1776/108 ලෙස ලියාපදිංචි කර ඇති පිඹුරුපත් අංක 2568, බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද, 1989 මාර්තු මස 29 වැනි දිනැති අංක 2568 දරන පිඹුරේ කොට්ටාව, පන්සල පාරේ පිහිටි සම්බුද්ධි ගොරකගහවත්ත ලෙස හැඳින්වෙන, ලොට් අංක ඩී ලෙස දැක්වෙන (මාර්ගය පුළුල් කිරීම සඳහා වෙන් කර ඇත) සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 0.60

2. හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක ජී 1571/266 ලෙස ලියාපදිංචි කර ඇති පිඹුරුපත් අංක 1559, බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද, 1983 නොවැම්බර් මස 11 වැනි දිනැති අංක 1559 දරන පිඹුරේ කොට්ටාව, පන්සල පාරේ පිහිටි සම්බුද්ධ ගොරකගහවත්ත ලෙස හැඳින්වෙන, ලොට් අංක 3 ලෙස දැක්වෙන (අඩි 12 ක මාර්ගය සඳහා වෙන් කර ඇත) සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ්. 0, පර්. 18

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. හේවාවිතාරණ විසින් සහතික කරන ලද 2009 ජූනි 17 සහ 2009 ජූලි 18 දිනැති අංක 418 දරන සමගාමී උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද 2011 ජූලි 12 සහ 2011 ජූලි 15 දිනැති අංක 320 දරන සමගාමී උකස්කරයන් ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජතානාත්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ නීතිගත වූ ලියාපදිංචි අංක PV 10716 දරන (පැරණි අංකය N (PVS) 33259) සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 134/1, පන්සල පාර, මහරගම පිහිටි සෙල්ටා ප්‍රයිවට් ලිමිටඩ් විසින් (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 පෙබරවාරි මස 06 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 115,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය".

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-491

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.